# 多言語情報コーナー　　　　　　　　　（令和６年　６月号）

## 1. කොම්බිනි වෙළඳසැල් මගින් ලබාගතහැකි බදු සහතික නිකුත් කිරීමේ සේවාව පිළිබඳ දැනුවත් කිරීම

කොම්බිනි වෙළඳසැල් තුල ඇති මල්ටි කොපි යන්ත්‍රය මගින් එක් එක් පළාතේ නගර කාර්යාලය මගින් දෙනු ලබන "ආදායම් සහතිකය", "ස්ථිර පදිංචිය සනාථකරන සහතිකය ", "බදු ගෙවීමේ සහතිකය", "බදු වලින් නිදහස් බව සනාථ කරන සහතිකය'' ලබා ගත හැක.
කරුණාකර ඔබගේ පහසුව සඳහා සලසා ඇති මෙම සේවාවෙන් ප්‍රයෝජන ගන්න.

මෙම සේවාව භාවිතා කිරීම සඳහා , ඔබට මයි නම්බර් කාඩ්පතක් අවශ්‍ය වේ.
ඊට අමතරව, ඔබ වසරේ ජනවාරි 1 වන දින,වනවිට තොචිගි නගරයේ ලිපිනයක් තිබිය යුතු අතර ප්‍රකාශනය කරන අවස්ථාවේ ටොචිගි නගරයේ ලිපිනයක් ඇති අයට පමණක් නිකුත් කළ හැකිය. උදාහරණයක් ලෙස, ඔබ 2023 (රෙයිවා 5) වන වසර සඳහා සහතිකයක් ඉල්ලන්නේ නම්, ඔබට තොචිගි නගරය තුල ලිපිනයක් තිබිය යුතුය.

දැනට සහතික නිකුත් කළ හැකි මූල්‍ය වර්ෂය සහ පසුගිය වසර දෙක සඳහා සහතික නිකුත් කළ හැකිය.
2023 (රෙයිවා 5 වන) වර්ෂයේ නිකුත් කරනු ලබන සතිකය යනු 2022 (රෙයිවා 4 වන) වන වසර තුල ලබා ඇති ආදායම වන අතර 2022 (රෙයිවා 4 වන) වර්ෂයේ නිකුත් කරනු ලබන සතිකය යනු 2021 (රෙයිවා 3 වන) වන වසර තුල ලබා ඇති ආදායම වන අතර 2021 (රෙයිව 3 වන) වර්ෂයේ නිකුත් කරනු ලබන සතිකය යනු 2020 (රෙයිවා 2 වන) වන වසර තුල ලබා ඇති ආදායම වේ.
2024(රෙයිවා 6) වන වසර සඳහා බදු සහතික නිකුත් කිරීම 2024 ජුනි මස මැද පමණ සිදුකරනු ලැබේ.

මෙම සේවාව ලබාගත හැකි වෙළඳසැල් ලෙස සවන් ඊලවන් ,ලෝසන් ,ෆැමිලි මාර්ට් ,මිනි ස්ටොප් ,ඉයොන් යන වෙළඳසැල් ඇතුළත් වේ.
මෙම සේවාව ලබාගත හැකි වේලාව ලෙස උදේ 6:30 සිට රාත්‍රී 11:00 දක්වා වේ.
සහතික නිකුත් කිරීමේ ගාස්තුව නගර ශාලාවේ කවුන්ටරයේ යෙන් 300 වන අතර ඉහත සඳහන් වෙළඳසැල් මගින් ලබගන්නේනම් යෙන් 200 ක මුදලකට ලබාගත හැක.එමගි ඔබට යෙන් 100 ඉතිරියක් වනු ඇත.
බදු ගෙවීමේ පත්‍රිකාව මූල්‍ය ආයතනයකට ගෙවීමෙන් පසු එය සහතිකයේ සටහන් වීමට සති දෙකේ සිට මාසයක් අතර කාලයක් ගතවනු ඇත.බදු ගෙවීමෙන් පසු සති 2ක් හෝ මාසයක් ඇතුලත ඔබට බදු ගෙවූ මුදලේ බදු සහතිකයක් අවශ්‍ය නම්, කරුණාකර ඔබ එම ගෙවූ බදු මුදලේ රිසිට් පත රැගෙන නගර ශාලාවේ හෝ සාමාන්‍ය ශාඛා කාර්යාලයේ කවුන්ටරය වෙත ඉදිරිපත් කිරීමෙන් එම සහතිකය ලබාගත හැක.

## 2. නාගරික බදු සහ ප්‍රාන්ත බදු සඳහා ස්ථාවර ප්‍රමාණයේ බදු අඩු කිරීම පිළිබඳව

ජපානයේ පසුගිය වසර කිහිපය තුළ භාණ්ඩවල මිල ගණන් අඛණ්ඩව ඉහළ ගොස් ඇත. ජපානයේ මුදල් ඒකකය වන යෙන් මුදලේ වටිනාකම දුර්වල වීම සහ භාණ්ඩ මිල ඉහළ යාම නිසා ආර්ථික වශයෙන් පීඩා විඳින බොහෝ පිරිසක් සිටිනු ඇතැයි විශ්වාස කෙරේ.සාමාන්‍යයෙන් භාණ්ඩවල මිල ඉහළ යන විට අපේ වැටුප් ද ඉහළ යාම සිදුවේ. නමුත් වර්තමානයේ පවතින තත්වය වන්නේ භාණ්ඩවල මිල වැඩිවීමට අනුව වැටුප් වැඩිවීමක් සිදු නොවීම වේ.
ඒ නිසා 2024 දී ආදායම් බදු සහ නේවාසික බද්ද අඩු කිරීමට "ස්ථාවර බදු අඩු කිරීමක්" ක්‍රියාත්මක කරනු ලැබේ.
බදු ගෙවන්නා සහ ඔහුගේ යැපෙන්නන් ඇතුලත්ව ආදායම් බද්ද යෙන් 30,000 ක් හෙවත් (මන් 3ක් ) ද නේවාසික බද්දෙන් යෙන් 10,000 ක් හෙවත් (මන් 1ක් ) ද සමග එක් පුද්ගලයකුගෙන් යෙන් 40,000 ක් හෙවත් (මන් 4ක ) මුදලක් 2024 ජූනි මාසයේ සිට අඩු කිරීම සිදුකරනු ලැබේ.උදාහරණයක් ලෙස, බදු ගෙවන්නෙකු සහ යැපෙන්නන් තිදෙනෙකු සිටී නම්, සම්පූර්ණ බදු අඩු කිරීම යෙන් 160,000 හෙවත් (මන් 16ක් ) වනු ඇත.

ඊට අමතරව, ආදායම් බදු හෝ නේවාසික බද්ද කුඩා මුදලක් නම් සහ බදු අඩු කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් එම අය වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

ස්ථාවර බදු අඩු කිරීම සඳහා සුදුසුකම් ලබන්නේ මුළු ආදායම යෙන් 18,050,000 (මන් 1,805ක් ) හෝ ඊට අඩු වන අතර, එම පුද්ගලයා, ඔහුගේ හෝ ඇයගේ සහකරු හෝ සහකාරිය, යැපෙන්නන් ජපානයේ පදිංචිකරුවන්ට සීමා වේ. විදේශයන්හි පදිංචි යැපෙන ඥාතීන් ස්ථාවර බදු අඩු කිරීම් සඳහා සුදුසුකම් නොලබයි.

බදු අඩු කිරීම නාගරික බදු සහ ප්‍රාන්ත බදුවල ආදායම් මුදලෙන් අඩු කරනු ලැබේ. නාගරික බදු/ප්‍රාන්ත බදු ගෙවීමේ දැනුම්දීමේ පත්‍රිකාව මගින් බදු අඩුකිරීමේ විස්තර සඳහන් කර ඇති බැවින් කරුණාකර එම තොරතුරු පරීක්ෂා කිරීමට වග බලා

## 3. 2024 වෛද්‍ය පරීක්ෂණය තොරතුරු පිළිබඳ

තොචිගි නගර කාර්යාලය මගින්  "2024 වෛද්‍ය පරීක්ෂණය පිළිබඳ තොරතුරු"ඇතුලත් නිල් ලියුම් කවරයක් මැයි මස මැදදී සෑම නිවසක් වෙත තැපැල් කරන ලදී.

එම ලියුම් කවරයේ වයස අවුරුදු 20 ට වැඩි සෑම පුද්ගලයෙකුටම එක් "වෛද්‍ය පරීක්ෂණය පිළිබඳ බලපත්‍රයක්" සහ එක් නිවසකට "වෛද්‍ය පරීක්ෂණය පිළිබඳ මාර්ගෝපදේශ පොතක්" අඩංගු වේ.

"වෛද්‍ය පරීක්ෂණ බලපත්‍රය" යනු වයස අවුරුදු 20 ට වැඩි පුද්ගලයින් සඳහා වෛද්‍ය පරීක්ෂණ පිළිබඳ තොරතුරු සහ ඊට අදාල ප්‍රවේශපත්‍ර පිළිබඳ තොරතුරු අඩංගු කුඩා පොතකි.

"වෛද්‍ය පරීක්ෂණ මාර්ගෝපදේසක පොත " යනු පවුලේ සියලුම සාමාජිකයින්ට පොදු වන වෛද්‍ය පරීක්ෂණ පිළිබඳ තොරතුරු සම්පාදනය කරන කුඩා පොත් පිංචකි. පොදු වෛද්‍ය පරීක්ෂණ සඳහා එක් එක් ස්ථානය සඳහා කාලසටහන මෙන්ම වෙන වෙනම පරීක්ෂණ අන්තර්ගත තොරතුරු සඳහන් වේ.

වෛද්‍ය පරීක්ෂණය සඳහා ස්ථානය සහ දිනය වෙන්කර ගැනීම මැයි මස 28 වන අඟහරුවාදා සිට ආරම්භ කරනු ලැබේ.

ඔබේ සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීම සඳහා වසරකට වරක් සෞඛ්‍ය පරීක්ෂණයක් කිරීමට වග බලා ගන්න.